# ශ්‍රී ලංකාවේ මුද්‍රිත මාධ්‍ය විසින්
# මෙරටේ ජනවාර්ගික අර්බුදය වාර්තා කිරීමේ ස්වරූපය පිළිබඳ අධ්‍යයනයක්

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
04 JUL 2013
UNIVERSITY OF KELANIYA

විභාග අංකය :FGS / PS / MSSc / 2004/06
නම :කේ.ආර්.ඩී.වයි.එම්.එස්.කරුණාරත්න



| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 817 |
| වර්ග අංකය: | |



කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති
පශ්චාද් උපාධි (දේශපාලන විද්‍යා) පරීක්ෂණයෙහි
පාර්ශ්වීය අවශ්‍යතාවක් සම්පූර්ණ කිරීම සඳහා
ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධනයකි

2010/ජූලි

# නිබන්ධන සාරාංශය

යටත්විජිත සමයෙන් පසු ලංකාවේ පාලක පංතිය රටේ බහුවාර්ගික යථාර්ථය නිසියාකාරව අවබෝධ කොට ගෙන කටයුතු කිරීමට අපොහොසත් වීම නිසා උද්ගත වූ මෙරටේ ජනවාර්ගික දේශපාලන අර්බුදය විසැඳීමෙහිලා සිංහල හා දෙමළ මාධ්‍ය පුවත්පත් විසින් ස්වකීය කතුවැකි හා විශේෂාංග ලිපි මඟින් කවරාකාර සාධනීය කතිකාවක් ගොඩනඟනු ලබන්නේ ද යන්න මෙම නිබන්ධනයෙන් විමර්ශනය කෙරේ. රජයේ හා පෞද්ගලික අංශයට අයත් සිංහල හා දෙමළ දිනපතා පුවත්පත් හයක් විසින් මාස හයක (2006-07-01 සිට 2006-12-31 දක්වා) කාලය තුළ තත් විෂයය සම්බන්ධයෙන් පළ කෙරුණු කතුවැකි හා විශේෂාංග ලිපි ආශ්‍රයෙන් අන්තර්ගත විශ්ලේෂණ අධ්‍යයන ක්‍රමවේදය භාවිත කරමින් මෙම අධ්‍යයනය සිදු කොට ඇත.

තත් විෂයය සම්බන්ධයෙන් කතුවැකි හා විශේෂාංග ලිපි පළ කිරීමේ දී සිංහල හා දෙමළ පුවත්පත් ස්වකීය පුවත්පතෙන් ප්‍රමාණවත් ඉඩක් ලබා දීමට ඉදිරිපත් වුවත් එහිදී අර්බුදය විසැඳීමෙහිලා සමස්ත සමාජය වෙත සාධනීය කතිකාවක් ගොඩනැඟීමට උත්සුක වන්නේ නැත. වෘත්තීය ආචාර ධර්ම මත පිහිටා අර්බුදය යථාර්ථවාදී ව විග්‍රහ කිරීම පසෙකලා තම වාර්ගික විඥානය කේන්ද්‍ර කොට ගනිමින් ස්වකීය පාඨක ලෝකයා ආමන්ත්‍රණය කිරීමට සිංහල හා දෙමළ පුවත්පත් පෙළැඹී සිටී. එමඟින් සිංහල හා දෙමළ පාඨකයාට තත් අර්බුදයට මැදි වී සිටින අන් පාර්ශ්වය පිළිබඳ නිරවුල් අවබෝධයක් ලබා ගැනීමට අපොහොසත් වන අතර ම මෙරට සමාජය ද වාර්ගිකව සිංහල හා දෙමළ යන අන්ත දෙකකට ධ්‍රැවීකරණය වීමට ද හේතුකාරක වේ.

විශේෂයෙන් ගැටුම් වාර්තා කිරීමේදී මාධ්‍ය භාවිතාව සිදු කළ යුත්තේ කවරාකාරයෙන් ද යන්න මාධ්‍ය නියාමනයන් හෝ ඒ පිළිබඳ විමර්ශනය කරන නෛතික ආයතන පද්ධතියක් හෝ සංස්ථාපිතව නැති වීම බරපතළ කරුණෙකි. එනිසා මාධ්‍ය විශාරදයන් හා වෘත්තිකයන්ගේ මූලිකත්වයෙන් අන්තර්ජාතික මාධ්‍ය නියාමනයන් හා ප්‍රත්පත්ති ද සැලැකිල්ලට ගනිමින් මෙරටේ බහුවාර්ගික සමාජ පැවැත්මට හිතකර මාධ්‍ය ප්‍රතිපත්තියක් සම්පාදනය කොට බලාත්මක කිරීමට පියවර ගත යුතු ය.



**මුඛ්‍ය පද (Keywords) :** යුගල ප්‍රතිපක්ෂ (binary opposition), වාර්ගික විඥානය, වාර්ගික අගතීන් (racial prejudice), ධරණීය/සාධනීය කතිකාව, ආඛ්‍යාන මාධ්‍ය භාවිතය